කැනඩාවේ අයෙකු විසින් යාපනයේ පදිංචි පුද්ගලයෙකු එවන ලද රුපියල් මිලියන 84 ක් පමණ වටිනාකමක මත්ද්‍රව්‍ය තොගයක්, රේගුව විසින් අත්අඩංගුවට ගැනීම මාධ්‍ය අවධානයට ලක්ව තිබිණි.
ඒ පිළිබඳව, අප්‍රේල් 26, 2023 පුවත්පත් තුනක් වාර්තා කර තිබුණේ මෙලෙසිනි.
අරුණ - "කැනඩාවේ පදිංචි දෙමළ ජාතිකයකු විසින් යාපනයේ පදිංචි අයෙකුට...එවන ලද..."
දිනමිණ - "...කැනඩාවේ වාසය කරන ද්‍රවිඩ ජාතිකයෙකු විසින් යාපනය ප්‍රදේශයේ පදිංචි ද්‍රවිඩ ජාතිකයෙකු වෙත එවා තිබිණි."
අද - "කැනඩාවේ පදිංචි පුද්ගලයෙකු විසින් යාපනයේ පදිංචිකරුවෙකුට එවා තිබූ භාණ්ඩ..."
1) මෙම පුවත සඳහා අදාල සැකකටයුතු පුද්ගලයින් "ද්‍රවිඩ" වීම අදාළ යැයි ඔබ සිතන්නේද?
2) එම වාර්ගිකත්වය පුවතට අදාළ නම්, අරුණ සහ දිනමිණ වාර්ගිකත්වයන් විශේෂ කොට සඳහන් කිරීමේ පදනම කුමක්ද? වාර්ගිකත්වයන් පුවතට අදාළ යැයි ඔබ සිතන්නේ නම්, අද පුවත්පත එම වාර්ගිකත්වය සඳහන් නොකරමින් පුවත ඉදිරිපත් කර ඇත්තේ මන්ද?
(මෙම පුවත එදින වීරකේසරී, ටැමිල් මිරර් සහ තිනකරන් පුවත්පත් තුළ වාර්තා වී නොතිබුණි. තිනකුරල් සහ තමිලන් මෙම පුවත එදින වාර්තා කර තිබුණ ද, එම පුවත් වාර්තාවන් තුළ සැකකරුවන්ගේ වාර්ගිකත්වයක් සඳහන් වී නොතිබුණි.)
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

